**හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සිවිල් සමාජයේ ස්ථාවරය**

පහත අත්සන් තබන ලද අපි, පුරවැසියන් හා සිවිල් සමාජ සමාජිකයන් ලෙස, ශ්‍රී ලංකාවේ මහජන ආරක්ෂණ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීමට ජනාධිපතිවරයා විසින් ගත් තීරණය පිළිබඳව දැඩි අවධානය යොමු කර සිටින්නෙමු.

පෙනෙන ආකාරයට, මෙම හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කරනු ලැබුයේ, කොවිඩ්-19 වසංගත පසුබිම තුළ ශ්‍රී ලංකාවේ පවතින සෞඛ්‍යය හදිසි අවස්ථා තත්ත්වය සැලකිල්ලට ගනිමින්, ප්‍රජාවගේ ජන ජීවිතයට අත්‍යාවශ්‍ය වන්නාවූ සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම මඟින් මහජන ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා ය. භාණ්ඩ තොග සඟවා තබා ගැනීම, අයුතු ලෙස ලාභ ඉපයීම සහ භාණ්ඩ නිවැරදිව බෙදා නොහැරීම යනාදී ක්‍රියාවන් නැවැත්වීමට තමන් අදහස් කරන බව ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කර තිබේ. මූලික ආහාර ද්‍රව්‍යවල මිල දිගින් දිගටම ඉහළ යාම සාමාන්‍ය මහජනයාට දැරිය නොහැකි බව ජනාධිපතිවරයා පිළිගෙන නැත. තවද, ආනයනය සම්බන්ධයෙන් ගත් පදනම් විරහිත තීන්දු සහ මූලික අත්‍යාවශ්‍ය භාණ්ඩ සීමා කිරීම් මෙම තත්ත්වයට දායක වී ඇත. අඩුවෙමින් යන විදේශ විනිමය සංචිත හේතුවෙන් ආනයන සීමා කිරීම ආහාර ද්‍රව්‍ය ආනයනය වලක්වනු ඇති බවත් ආහාර හිඟයකට මග පෑදෙනු ඇතිබවත්, මේ හේතුවෙන් ශ්‍රී ලංකාව ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් එළඹෙනු ඇති අභියෝග අභිමුඛයේ සිටින බවත් අපට ප්‍රතික්ෂේප කළ නොහැකිය. මෙය පුළුල් ලෙස සාකච්ඡා කෙරෙන සහ අපේක්ෂා කෙරෙන කරුණක් බවට පත් වී තිබේ.

වසංගතයේ බලපෑමක් නොමැති  මූල්‍ය අර්බුදයකට ශ්‍රී ලංකාව මුහුණපාමින් සිටී. දශක ගණනාවක් තිස්සේ රජයන් විසින් කිසිදු වග විභාගයකින් තොරව කරන ලද වියදම් මෙයට දායක වී ඇති අතර, වසංගත කාලය තුළ අධික මුදල් අච්චු ගැසීම ඩොලරය ඉදිරියේ රුපියලේ අගය අවප්‍රමාණය කිරීමට හේතුවිය. ආහාරවල මිල ගණන් අහස උසට නැඟ ඇත. විධිමත් බැංකු පද්ධතියේ විදේශ විනිමය සංචිත හිඟ වීම සහ විදේශ විනිමය උත්පාදනය සඳහා අවිධිමත් (කළු කඩ) ව්‍යාපාර වර්ධනය වීම යන කරුණු ආනයනකරුවන්, අපනයනකරුවන් සහ වෙළඳ ව්‍යාපාරිකයන් අතර ද භීතියක් ඇති කර තිබේ.

කෘත්‍රිම ආහාර හිඟ සහ මිල ගණන් ඉහළ යාම්  නිර්මාණය කිරීමට හේතු වෙමින් රජය විසින් යෝජනා කර ක්‍රියාත්මක කරන ලද අත්තනෝමති ක ප්‍රතිපත්ති කිහිපයක සන්දර්භය තුළ පිහිටමින් ආහාර ආනයනය සහ වෙළෙඳාම පිළිබඳව ද විශ්ලේෂණයකළ යුතුව තිබේ.මේ අතරින් වඩාත් මතකයේ රැඳෙනුයේ කහ, උළුඳු (දෙමළ ප්‍රජාවගේ මූලික ආහාරයකි) සහ රසායනික පොහොර ආනයනය හදිසියේම තහනමට ලක්වීම සහ සීනි සහ ලූණු වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ආනයනය මත පනවනබදු හදිසියේ අඩුකිරීම සහ ඉන්පසුව වැඩිකිරීම ය. මේ සෑම පියවරක්ම ගජමිතුරු ධනපතින් පිරිසකගේ හුදු ප්‍රයෝජනය සඳහා කරන ලද කුමන්ත්‍රණයක් බව හොඳින්ම වැටහෙන කරුණකි.

මෙම තත්ත්වය තුළ ජනාධිපතිතුමා විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමට සහ විශේෂයෙන් 2021 අගෝස්තු 30 දිනැති අංක 2243/3 ගැසට් පත්‍රයේ පළවූ 2021 අංක 1 දරණ හදිසි අවස්ථා (අත්‍යාවශ්‍ය ආහාර සැපයීමේ) නියෝගය ක්‍රියාත්මක කිරීමට ගත් තීරණය සැක සහිතය. හදිසි අවස්ථාව ප්‍රකාශයට පත්කිරීම ආහාර සැපයීම ස්ථාවර කිරීමට ගත් පියවරක් වශයෙන් පෙනෙන්නට තිබුණත්, හදිසි තත්වයක් ප්‍රකාශයට පත්කිරීම මඟින් ජනාධිපතිවරයාට සීමිත සංවරණ සහ තුලන පමණක් ඇතිව පුළුල් බලතල ලබා දෙයි.

2021 අගෝස්තු 30 වන දින නිකුත් වූ හදිසි අවස්ථා ප්‍රකාශයත් සමඟ, **ඕනෑම විෂයයක් සම්බන්ධයෙන්, ඕනෑම අවස්ථාවක** කටයුතු කරන හදිසි අවස්ථා රෙගුලාසි පැනවීමට ජනාධිපතිවරයාට දැන් හැකියාව ලැබේ. හදිසි නීතිය, ආරක්ෂාව සම්බන්ධ වෙනත් නීති සහ එහි ගැඹුරු ලෙස මුල්බැස ගෙන ඇති මර්දනය පිළිබඳ ශ්‍රී ලංකාවේ දිගු ඉතිහාසය සලකා බැලීමේදී, මෙම හදිසි නීතිය පිළිබඳ ප්‍රකාශය බරපතල ලෙස සැලකිල්ල යොමුකළයුතු කාරණා ඉස්මතු කරයි.

වසංගත කාලය තුළ ඵලදායී නායකත්වයක් සැපයීම සඳහා අතිවිශේෂ බලතල වශයෙන් ජනාධිපතිවරයා තවත් බලාපොරොත්තු වන්නේ කුමක්ද? 2019 නොවැම්බර් 16 වන දින මිලියන 6.9 ක ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් දැඩි ජනතා පරමාධිපත්‍යයක් ඇතිව ජනාධිපතිවරයා බලයට පත්

විය. ඔහුට පාර්ලිමේන්තුවේ ආසන 145 ක සහාය හිමි විය. එසේ තිබියදී සහ රට වසංගතයට ගොදුරු වෙමින් තිබියදී, ජනාධිපතිවරයාට අමතර බලයක් ලබාදීම පිණිස සහ විධායක බලතල භාවිතා කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවති සීමාකිරීම් ඉවත් කිරීම පිණිස 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගැනීමට ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව සැහෙන දේශපාලනික බලයක් ආයෝජනය ලදී. මෙම බලතල යොදාගනිමින් විපක්ෂය සමඟ ද්විපාක්ෂික එකඟතාවන් ඇති කරගැනීමේ අවස්ථාව පසෙක ලමින් ප්‍රමුඛ පෙළේ ධුර සඳහා පුද්ගලයින්ට පත්වීම් ලබාදීමට ජනාධිපතිවරයා ක්‍රියා කළේය. රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ තනතුරුවල පුරප්පාඩු සන්නද්ධ (හමුදා) සේවයෙන් විශ්‍රාම ගිය පුද්ගලයන්ගෙන් පුරවන ලදී. කොවිඩ්-19 කාර්ය සාධක බලකාය හමුදා නිළධාරින්ගේ ආධිපත්‍යය යටතේ පවතින අතර, වෛද්‍ය වෘත්තිය සහ රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ ප්‍රධාන වෘත්තිකයන් ප්‍රතිපත්ති සහ තීරණ සම්පාදකයන් කරගන්නවා වෙනුවට කාර්යයන් ක්‍රියාත්මක කරන්නන් බවට පත්කොට මෙම ක්‍රියාවලියේ දී පසෙකට දමා ඇත.

වසංගත, ආපදා කළමනාකරණ විෂය පථය යටතට ඇතුළත් වන බැවින්, විශේෂයෙන් වසංගත කළමනාකරණය සඳහා වන 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත ආධාර කරගැනීම රජය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙවන් ආපදාවන්ගෙන් සිදුවිය හැකි බලපෑම කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට අවශ්‍ය කරන සැලසුම් සකස් කරන, රජයේ ශාඛා බොහෝමය ක් ඇතුළත් කරමින් සභාවක් පිහිටුවීමට මෙම පනත මඟින් විධිවිධාන සලසා තිබේ. කෙසේනමුත් අත්‍යාවශ්‍ය සැපයුම් කළමනාකරණය සම්බන්ධයෙන් රජය වඩාත් කැමැත්තක් දක්වන්නේ හමුදාකරණය වූ ප්‍රතිචාරයක් දැක්වීමටයි.

ජනාධිපතිවරයා විසින් දැනට ආහාර සුරක්ෂිතතාව හමුදාව අතට පත් කරමින් සිටී. වර්තමානයේ සහල් සහ සීනි වැනි විශේෂිත ආහාර තොග බෙදාහැරීම සම්බන්ධයෙන් අවධානය යොමුව තිබේ. වී, සහල් ඇතුළු ඕනෑම අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සහ මහජනයාට සේවය සැපයීම අරමුණු කරගත් එවැනි දෑ ප්‍රවාහනය කරන වාහන අල්ලා ගැනීම (නැවැත්වීම) පමණක් නිසි බලධරයකු මඟින් සිදු නොකළ යුතුය. මෙය පුළුල් සහ අසීමිත බලය යොදා ගැනීමකි. පශ්චාත් යුධ සමය තුළ ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන් හමුදාවේ භූමිකාව සහ හමුදාව විසින් පාලනය කරන වෙළෙඳ සැල්හරහා භාණ්ඩ බෙදා හැරීම යනාදි ක්‍රියාවන් දේශීය වෙළෙඳුන් සහ ව්‍යාපාර අධෛර්යයට පත් කිරීම හේතුවෙන් එම ක්‍රියා සම්බන්ධයෙන් දැනටමත් විවේචනයට ලක්ව ඇත.

භාණ්ඩ තොග සඟවා තැබීම වැළැක්වීම සහ බෙදාහැරීමේ පහසුකම් සැලසීම කෙරෙහි රෙගුලාසි හරහා අවධානය යොමු කර තිබෙන අතර, මෙවැනි ක්‍රියාවල පටිපාටිය සහ ප්‍රතිඵලය පිළිබඳව මහජනයා නොදැනුවත් ය. අල්ලාගනු ලබන (රජය භාරයට ගනු ලබන) තොගවලට සිදු වන්නේ කුමක්ද? ගබඩා වැටලූ විට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව ජනතාව දැන ගන්නේ කෙසේද? අත්අඩංගුවට ගත් සියළුම තොග සතොසට ලබා දෙයිද? ඒවා සම්බන්ධයෙන් මහජනයාට ලබාගතහැකි වාර්තා තිබෙනු ඇති ද? භාණ්ඩ තොග සැඟවූ පුද්ගලයන්ට ලබා දෙන දඬුවම් මොනවාද? වරදකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමට අධිකරණමය ක්‍රියාවලියක් සිදු වේවිද?

මෙම රෙගුලාසිය ඉතා හොඳින් සලකා බැලිමේදී පෙනෙන්නට ඇත්තේ, භාණ්ඩ මිලදී ගැනීම සහ ඒවා මහජනයාට බෙදාහැරීම සඳහා පමණක් ඒවායේ අරමුණ සීමා නොවන බවයි. එය 'අත්‍යාවශ්‍ය සේවා' කළමනාකරණය සඳහා ද බලපවත්වයි. උද්ඝෝෂණයන්ගේ සිට වැඩ වර්ජන දක්වා "අත්‍යාවශ්‍ය සේවා" සඳහා බාධා පමුණුවනු ඇති බවක් සලකන ඕනෑම ක්‍රියාවක් මහජන ආරක්ෂණ ආඥා පනත උල්ලංඝනය කිරීමක් සේ සලකනු ලබයි.

සිවිල් සමාජ සාමූහිකය වශයෙන් අපි, රාජ්‍ය පරිපාලනයේ සෑම අංශයක්ම හමුදාව විසින් කළමනාකරණය කළ හැකිය සහ කළ යුතුය යන මතයට විරෝධය පළ කරන අතරම එය තරයේ හෙළා දකිමු. මෙම ආකල්ප සහ ප්‍රවේශයන් රාජ්‍ය සේවයේ චිත්ත ධෛර්යය බිඳ දමන අතර, එයින් එහි වඩාත් දක්ෂ වෘත්තිකයන් අහිමි කරවා ඇත. එය පුරවැසියන් නිශ්ශබ්ද කරවන අණදෙන පාලන සංස්කෘතියක් ඇති කරන අතර, මෙය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට සුභ ලකුණක් නොවේ. ඇත්ත වශයෙන්ම මෙය අප රට ඒකාධිපති පාලනයක් කරා යොමු කරවන අතර පාර්ලිමේන්තුවේ ස්වෛරීත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී වගවීම මුලිනුපුටා දමනු ඇත.

ශ්‍රී ලංකාව හදිසි නීතිය යටතේ දශක ගණනාවක් පාලනය වූ බව සහ බොහෝමයක් නීති කිසිදු සලකාබැලීමක් හෝ විවාදයක් නොමැතිව පාර්ලිමේන්තුව හරහා බලාත්මක කිරීමට එය මග පෑදූ බව ද අපි රජයට සහ මහජනතාවට මතක් කර දෙමු. ජීවිතයෙහි බලපෑමට ලක් වී ඇති බොහෝ පැතිකඩ කළමනාකරණය කිරීම සඳහා ජනාධිපතිවරයාට පවතින බලයෙහි අඩුවක් නොමැත. සංකේන්ද්‍රණය වූ බලය වගකීම්වල සංකේන්ද්‍රණයකට යොමු විය යුතු අතර, අවසානයේදී ජනාධිපතිවරයා සහ ඔහු විසින් පත්කරන ලද පිරිස් විසින්, වසංගතයට ශ්‍රී ලංකාව දක්වන ප්‍රතිචාරය අසංවිධිත වී ඇත්තේ ඇයි, අපේ ආසාදිත හා මරණ අනුපාත ඉහළ යන්නේ ඇයි සහ ජනතාව කිසිදු උපකාරයක් - ආහාර, අවශ්‍ය සෞඛ්‍යය පහසුකම් සහ මූලික අවශ්‍යතා නොමැතිව අත්හැර දමා ඇත්තේ ඇයි ද යන ප්‍රශ්න වලට ජනතාව වෙත පිළිතුරු සැපයිය යුතුය.

Endorsing

Organizations

1. Rural Development Foundation
2. Law and Society Trust
3. Women Development Innovators
4. Centre for Human Rights and Development
5. Mannar Women's Development Federation
6. Women's Action Network
7. Alliance for Minorities
8. Rule of Law Forum
9. Family Rehabilitation Center
10. International Center for Ethnic Studies
11. Dabindu Collective
12. Anuradhapura District Citizen Committee
13. Rights Now Collective for Democracy
14. SAVISTHRI National Women Movement
15. Women Action for Social Justice
16. Women Centre
17. Mannar Social and Economical Development Organization -(MSEDO)
18. Centre for Equality and Justice
19. The Forum for a Plural Democracy
20. The Women and Media Collective
21. Gender, Social Capital, and Rural Community Development
22. Right to Life
23. The Centre for Society and Religion (CSR)
24. Janawaboda Kendraya
25. Prabathaya Art and Media organization
26. Movement for Land and Agriculture Reforms (MONLAR)
27. People's Alliance for Right to Land (PARL)
28. Women's Action for Social Justice(WASJ)
29. Ceylon Mercantile Industrial & General Workers Union (**CMU**)
30. Muslim Women's Development Trust
31. FIAN Sri Lanka
32. Federation of Media Employees Trade Union
33. RED Organization
34. Uva Shakthi Foundation
35. Suriya Women's Development Centre

Individuals

1. Ranitha Gnanarajah AAL
2. Shreen Abdul Saroor
3. Sarala Emmanuel
4. Nalini Ratnarajah
5. Lahiru Perera
6. Jehan Jegatheesan

7. Ambika Satkunanathan
8. Dr. Tush Wickramanayake
9. Dr. Sakuntala Kadirgamar
10. P.N.Singham
11. Mario Gomez
12. Nishan Fonseka
13. Chulani Kodikara
14. Bhavani Fonseka
15. Ruki Fernando
16. Dulan Disanayake
17. Perameswaran Thuwaraha
18. Nimalka Fernando
19. B. Gowthaman
20. Roshini D. Weerasinghe
21. Mirak Raheem
22. Nimal Dissanayake
23. Jayanthi Kuru-Utumpala
24. Probhoda Rathnayake
25. Anuratha Rajaretnam
26. Abdul Raheems
27. Ameer Faaiz
28. A. Dorin Rajani
29. Ranitha Gnanarajah
30. Padma Pushpakanthi
31. Inoma Karunatilake
32. Yartan Figurado
33. Melani Manel Perera - Journalist
34. Sr.Deepa Fernando - HF Sister
35. Sr. Sharmani Fernando - HF Sister
36. Sriyanthi Perera - HF Associate
37. Rita Fernando - HF Associate
38. Theresa Rajapaksa - HF Associate
39. Shivanthi Fernando - HF Associate
40. Shirani Cooray
41. P.Muthulingam
42. Marisa de Silva
43. Shyamala Gomez
44. Anthony Jesudasan
45. S.C.C.Elankovan
46. Ashila Dandeniya
47. Nishadi Somaratne
48. Visakha Tillekeratne
49. Philip Disanayake
50. Thiyagaraja Waradas
51. Thilak Kariyawasam
52. Anushaya Collure
53. Sr. Rasika Pieris - HF Sister
54. Nimal Perera
55. Renuka Fernando